ආයතනයේ නම : රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ඟිණුම් පිළිබඳ කාරක සභාව විසින්
සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන්
ස්ථාවර නියෝග අංක 119(4) යටතේ
ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර
පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 183

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

පළමු කොටස : 86.00

	කමිටුව විසින් හඳුනාගත් අඩුපාඩු	එම අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය ගෙන ඇති පියවර / වර්තමාන තත්ත්වය
01.	හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර ඇත.
02.	2017.06.26 දිනැති අංක 1/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 13 ඡේදය ප්‍රකාරව චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු නිලධාරියෙකු පත්කර කොමිට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත දන්වා නොතිබුණි.	2017.06.26 දිනැති අංක 1/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 13 ඡේදය ප්‍රකාරව චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා 2021 වර්ෂයේදී නිලධාරියෙකු පත්කර කොමිට්‍රෝලර් ජනරාල් වෙත දන්වා යවා ඇත.
03.	වාහනයක් ගර්හිත වී මාස 6කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	වාහන අපහරණ කටයුතු සිදුකරමින් පවති.
04.	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ තිදෙනෙකුගේ පමණක් ඇති අතර, එම ණය ශේෂ වර්ෂ 29ක්, වර්ෂ 16ක් සහ වර්ෂ 02ක කාලයක් ගත වූ ණය ශේෂයන් ය. i. ඉන් වර්ෂ 29ක් වූ ණය ශේෂය සම්බන්ධයෙන් කටයුතු කර හිඟ ණය ශේෂ කපා හැරීම සම්බන්ධයෙන් කටයුතු කර ඇත. ii. වර්ෂ 16ක් වූ ණය ශේෂය වැඩ තහනමට ලක් වූ නිලධාරියෙකු හේතුවෙන් ඇති වී තිබෙන අතර, මෙම හිඟ ණය ශේෂය පියවීම සම්බන්ධ නීතිමය කටයුතු සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත භාරදී ඇත. iii. වසර 02ක් වූ ණය ශේෂය සේවය හැර ගොස් ඇති නිලධාරියකු හේතුවෙන් ඇති වී තිබෙන අතර, මෙම හිඟ ණය ශේෂය පියවීම සම්බන්ධ නීතිමය කටයුතු සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත භාරදී ඇත.

05.	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්ත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කරන ලද තත්ත්කාර්ය අතුරු අග්‍රිමයන් අදාළ කාර්යය නිමවී මාසයක් අතුළත පියවීමට කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කර ඇති අතර, මේ වන විට නියමිත කාල වකවානු තුළ අදාළ පියවීම් නිවැරදිව සිදු කරගෙන යනු ලැබේ.
06.	සමාලෝචිත වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු කාර්ය සාධන වාර්තා නියමිත දිනට ඉදිරිපත් කර නොතිබුණි.	කොවිඩ්-19 වසංගත තත්ත්වය තුළ 2020 කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කිරීම ප්‍රමාද වුවද, 2021 කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අදාළ අමාත්‍යතුමාගේ ආවරණ ලිපිය ලබා ගැනීම සඳහා අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇත.

දෙවන කොටස : 73.00

	කමිටුව විසින් හඳුනාගත් අඩුපාඩු	එම අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය ගෙන ඇති පියවර / වර්තමාන තත්ත්වය
01.	මහජනයා විසින් ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබාදීම / ලබා නොදීම සම්බන්ධව විස්තර ඇතුළත් ලේඛනයක් පවත්වා නොතිබුණි.	මහජනයා විසින් ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබාදීම / ලබා නොදීම සම්බන්ධව විස්තර ඇතුළත් ලේඛනයක් 2020 වර්ෂයේ සිට යාවත්කාලීන කර ඇත.
02.	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	සමස්ථ කාර්ය මණ්ඩලය ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුමක් සකස් කර ගිවිසුම් ගතව ඇත.
03.	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2020/2021 වර්ෂ තුළ කොරෝනා වසංගත තත්ත්වය පැතිරීම නිසා වරින්වර කාර්යාලය වසා තැබීම හා නිලධාරීන් සේවා මුර ක්‍රමයක් යටතේ සේවයට වාර්තා කිරීම මෙන්ම පිරිස් ඒකරාශී වීම අවම වන සේ ක්‍රියාකරන ලෙස රජයේ කාර්යාල වෙත සෞඛ්‍ය මාර්ගෝපදේශ නිකුත් කරන ලද බැවින් සමූහ වශයෙන් පිරිස් ඒකරාශී කර පුහුණු වැඩසටහන් පැවැත්වීම සීමා කරන ලදි. එමෙන්ම පුහුණු වැඩසටහන් සංවිධානය කළද නිලධාරීන් කොවිඩ් වසංගතය පැතිරීමේ අවදානම නිසා ඒවාට සහභාගීවීම ප්‍රතික්ෂේප කරන ලදි. මෙවැනි තත්ත්වයක් තුළ පුහුණු වැඩසටහන් සීමා කිරීමට සිදු වූ නිසා සැලසුම් ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතීමට හේතු විය.
04.	විගණකාධිපතිවරයා විසින් ඡේදවලින් පෙන්වා දී තිබූ අඩුපාඩු / දෝෂ නිවැරදි කරවාගෙන නොතිබුණි.	විගණකාධිපතිවරයා විසින් ඡේදවලින් පෙන්වා දී තිබූ අඩුපාඩු / දෝෂ නිවැරදි කරන ලදි.

ජානක ධර්මකීර්ති
ලේකම්

සකස් කළේ :- ඩබ්.ඩී.නිළිණි දිනූෂා

පරීක්ෂා කළේ :- ප්‍රධාන ගණකාධිකාරී

නිර්දේශ කළේ :- ප්‍රධාන මූල්‍ය නිලධාරී